# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 26 වැනි කාණ්ඩය | අගෝස්තු 2022



## *නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරේ.*

නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් මේ මස 03 වැනිදා විවෘත කෙරිණි. ජනාධිපතිවරයාගේ උපදෙස් මත මෙම උත්සවය චාම් ලෙස පැවති අතර ඒ අනුව ආචාර වෙඩි මුර සහ රථ පෙළපාලි නොපැවැත්විණි.

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව










පුවත්

කාරක සභා පුවත්

පාර්ලිමේන්තු විදු පියසෙන්

කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# අන්තර්ගතය

## කාරක සභා පුවත්

- අමාත්‍යාංශ ලේකම්වරු පස්දෙනෙක් සහ තානාපතිවරයෙකුගේ පත් කිරීම සඳහා උසස් නිලතල කාරක සභාවේ අනුමතිය.
- නවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ කාරක සභා සඳහා සාමජික මන්ත්‍රීවරයන් පත් කෙරේ.

## පුවත්

- නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරේ.
- පාර්ලිමේන්තුව මේ මස 29 වැනිදා සිට පෙ.ව 9.30 ට ආරම්භ කිරීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කරයි - දිවා විවේකයත් පැය භාගයකට සීමා කෙරේ.
- ආර්ථිකය ස්ථාවර කිරීමට ආර්ථික සංවර්ධන වේගය ධන මට්ටමකට ගෙන ඒම සහ උද්දමනය පාලනය කිරීම සිදු කළ යුතුයි. - මහ බැංකු අධිපති
- ශ්‍රී ලංකා ආර්ථිකය යළි නගාසිටුවීමේ මාවතක් ලෙස ආදායම් උත්පාදනය පිළිබඳ සංවාදමය කතිකාවක් ගරු මන්ත්‍රීවරයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙයි.

## පාර්ලිමේන්තු විදු පියසෙන්

- පාර්ලිමේන්තු මන්ත්‍රිවරයන්ගේ කාර්යමණ්ඩලය සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේද පිළිබඳ විශේෂ වැඩසටහනක්

# කවරයේ කතාව



## නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරේ.

- ආචාර වෙඩි මුර සහ රථ පෙළපාලිවලින් තොර චාම් උත්සවයක්.
- ජනාධිපතිවරයා වෙනුවෙන් ත්‍රිවිධ හමුදා උත්තමාචාරයක්.

නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් මේ මස 03 වැනිදා විවෘත කෙරිණි. ජනාධිපතිවරයාගේ උපදෙස් මත මෙම උත්සවය චාම් ලෙස පැවති අතර ඒ අනුව ආචාර වෙඩි මුර සහ රථ පෙළපාලි නොපැවැත්විණි.

එදින පෙ.ව 9.50 ට පමණ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාගේ පැමිණීම සිදුවිය. ඉන් අනතුරුව අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පැමිණීම සිදුවූ අතර, ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු සිදුවූයේ ඉන් අනතුරුවයි.

එහිදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක යන මහත්වරු විසින් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ප්‍රධාන පියගැටපෙළ අසලදී ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පිළිගනු ලැබිණි.

එහිදී ත්‍රිවිධ හමුදා ජනාධිපති උත්තමාචාරයක් පිරිනැමීම සිදු විය. ඉන් අනතුරුව වේත්‍රධාරි, නියෝජ්‍ය වේත්‍රධාරි සහ සහකාර වේත්‍රධාරි පෙරටු කරගත් ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා, ජනාධිපතිතුමා පාර්ලිමේන්තු මන්දිරය වෙත කැඳවා ගෙන ගියහ.

එම අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල දී කොළඹ, දේවි බාලිකා විද්‍යාලයේ සිසුවියන් විසින් ජයමංගල ගාථා ගායනා කර, ජනාධිපතිතුමාට ආශිර්වාද එක් කළහ.

අනතුරුව පැළඳුම් කාමරයට පැමිණි ජනාධිපතිවරයා  පෙ.ව 10.25 පමණ වන තෙක් එහි රැඳී සිට සභාගර්භයට සෙංකෝලය රැගත් වේත්‍රධාරීවරයා ඇතුළු පිරිස සමග පෙරහරින් සභාගර්භයට පිවිසියේය. ඉන් අනතුරුව පෙ.ව 10.30 ට පමණ ජනාධිපතිවරයා සභාවේ මුලසුන දරමින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේය. ජනාධිපතිවරයාගේ අසුනේ මෙවර ජනාධිපතිවරයාගේ නිල ලාංඡනය වෙනුවට රාජ්‍ය ලාංඡනය සවිකර තිබීම විශේෂත්වයකි. ජනාධිපතිවරයා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමේන් අනතුරුව පාර්ලිමේන්තුව ලබන මේ මස 9 වැනිදා දක්වා කල් තැබීම සිදුවිය.

ඉන් පසු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ ආරාධිත අමුත්තන් වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් පැවැත්විණි.

ජනාධිපතිවරයා සහ ආර්යාව පාර්ලිමේන්තුවෙන් පිටත්ව යන අවස්ථාවේදී ද හමුදා උත්තමාචාරයක් පිරිනැමීම සිදුවිය.

නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභා වාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ අවස්ථාවට විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන්, අගවිනිසුරුතුමා, උපරිමාධිකරණ විනිසුරුවරුන්, නීතිපතිතුමා, ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාපතිවරු සහ පොලිස්පතිවරයා ඇතුළු ආරාධිත අමුත්තෝ රැසක් පැමිණ සිටියහ.







# පුවත්

## පාර්ලිමේන්තුව මේ මස 29 වැනිදා සිට පෙ.ව 9.30 ට ආරම්භ කිරීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කරයි - දිවා විවේකයත් පැය භාගයකට සීමා කෙරේ

පාර්ලිමේන්තුව මේ මස 29 වැනිදා සිට පෙ.ව 9.30 ට ආරම්භ කිරීමටත් දිවා විවේකය පැය භාගයකින් සීමාකොට ප.ව 12.30 සිට ප.ව 1.00 දක්වා පැවැත්වීමටත් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කර ඇති බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

මේ මස 10 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී මෙම තීරණය ගෙන ඇත.



# ආර්ථිකය ස්ථාවර කිරීමට ආර්ථික සංවර්ධන වේගය ධන මට්ටමකට ගෙන ඒම සහ උද්දමනය පාලනය කිරීම සිදු කළ යුතුයි - මහ බැංකු අධිපති

- අඩු ආදායම් ලාබීන් ආරක්ෂා කිරීමට සමාජ ආරක්ෂණ ජාල සඳහා මුදල් වෙන් කළ යුතුයි.
- ආනයනය සීමා කොට බණිජ තෙල්, බෙහෙත් සහ ගෑස් වැනි අත්‍යාවශ්‍ය දේ මිලදීගැනීම සිදු කළ යුතුයි.
- 14/15 % මට්ටමකට රාජ්‍ය ආදායම වැඩි කළ යුතුයි.
- ආර්ථික අර්බුදය නිසා ඇතිවන අපහසුතාව අඩු ආදායම් ලබන පාර්ශ්ව වලට පමණක් නොව වැඩි ආදායම් ලබන පාර්ශ්ව අතරද බෙදා හැරීම කළ යුතුයි.

ආර්ථික අරුබුදයකදී ප්‍රථමයෙන්ම ආරක්ෂාකරගත යුතු වන්නේ අඩු ආදායම් ලාබීන් බවත් එම නිසා ඔවුන් ආරක්ෂා කිරීමට සමාජ ආරක්ෂණ ජාල සඳහා මුදල් වෙන් කළ යුතු බවත් මහබැංකු අධිපති (ආචාර්ය) නන්දලාල් වීරසිංහ මහතා පැවසීය.



අඩු ආදායම් ලාබීන්ට ඇතිවන ආර්ථික අපහසුතා වැඩි වුවහොත් දුප්පත් මිනිසුන් පාරට බැසීම සිදු විය හැකි බවත් ඒ නිසා කලබලකාරී තත්ත්වයන් රට තුළ ඇති විය හැකි බවත් ඒ මහතා පෙන්වා දුන්නේ යි. එබැවින් වැඩි ආදායම් ලබන සහ අඩු ආදායම් ලබන දෙපාර්ශ්වය අතරම ඇතිවන ආර්ථික අපහසුතාව බෙදී යෑමට සැලැස්වීම මගින් අඩු ආදායම් ලබන පාර්ශ්ව වල අසහනය පාලනය කරමින් ආර්ථිකය ස්ථාවර කළ යුතු බව හෙතෙම වැඩි දුරටත් පෙන්වා දුන්නේය.



එසේම ණය ලබාගැනීම පාලනය කොට රාජ්‍ය ආදායම වැඩිකරගැනීමේ අවශ්‍යතාවද ඒ මහතා පෙන්වා දුන්නේය. මෙහිදී වර්තමානයේ ඇති වී තිබෙන උද්දමනය පාලනය කොට අපනයන ආදායම වැඩිකර ගැනීම සිදු කළ යුතු බව ද පැවසූ ඒ මහතා රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම කළමනාකරණය කර ගැනීම වැදගත් බව අවධාරණය කළේය.





මෙහිදී ආනයනය සීමාකිරීම මගින් පසුගිය වසරේ බිලියන 2 පමණ වූ වියදම මෙම වසරේ 1.3කට අඩු කරගැනීමට හැකි වූ බව පෙන්වා දුන් වීරසිංහ මහතා ඒ මගින් බෙහෙත්, ඛණිජ තෙල් සහ ගෑස් වැනි අත්‍යාවශ්‍ය දේ මිලදී ගැනීමට හැකි වූ බව පෙන්වා දුන්නේය. විශේෂයෙන්ම වර්තමාන රාජ්‍ය ආදායම බිලියන 1.2 පමණ වන බවත් තවදුරටත් අත්‍යාවශ්‍ය නොවන දෑ ආනයනය සීමාකිරීම මගින් රාජ්‍ය වියදම පාලනය කිරීමට හැකි නම් එය රාජ්‍ය ආදායම සම්බන්ධයෙන් වැදගත් වන බවත් හෙතෙම පැහැදිලි කළේය.

තවද මෙම අර්බුදය විසඳීම මාසයෙන් දෙකෙන් කළ නොහැකි දෙයක් බවත් අඩුම මේ වසරේ දෙසැම්බර් මාසය දක්වා වත් මෙම අපහසුතාවන් දරාගැනීමට සිදුවන බව තමා විශ්වාස කරන බවත් ඒ මහතා වැඩිදුරටත් පෙන්වා දුන්නේය. එසේම මෙම අර්බුදය මගහරවා ගැනීමට රාජ්‍ය ආදායම 14/15% ක මට්ටමකට වත් වැඩි කළ යුතු බව ද නන්දලාල් වීරසිංහ මහතා පැහැදිලි කළේය.

ඒ මහතා මේ බව සඳහන් කළේ "ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය සහ ඉදිරි දැක්ම" යන මැයෙන් මේ මස 31 වැනිදා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවති සංවාදමය කථිකාවට සහභාගී වෙමිනි.

පාර්ලිමේන්තු විවාදයන්හිදී, මූල්‍යමය කාරණා සම්බන්ධව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය තහවුරු කිරීම සහ රටේ වර්තමාන ආර්ථික තත්ත්වය සහ ඉදිරි ආර්ථික මඟ පිළිබඳ ඵලදායී කථිකාවක් ඇති කිරීම වෙනුවෙන් මෙම වැඩසටහන පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය විසින් සංවිධානය කර තිබිණි.



# ශ්‍රී ලංකා ආර්ථිකය යළි නගාසිටුවීමේ මාවතක් ලෙස ආදායම් උත්පාදනය පිළිබඳ සංවාදමය කතිකාවක් ගරු මන්ත්‍රීවරයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙයි



ශ්‍රී ලංකා ආර්ථිකය යළි නගාසිටුවීමේ මාවතක් ලෙස ආදායම් උත්පාදනය පිළිබඳ සංවාදමය කතිකාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහභාගීත්වයෙන් මේ මස 09 වැනිදා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි. ජාත්‍යන්තර ආර්ථික සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙක් වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තිරසර මූල්‍ය කේන්ද්‍රයේ (Sustainable Finance Hub of the UNDP) අධ්‍යක්ෂ මාකෝස් නෙටෝ (Marcos Neto) මහතා මෙහි ආරාධිත දේශනය ඉදිරිපත් කරමින් සිය අත්දැකීම් සහ දැනුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග බෙදාහදා ගැනීම සිදුවිය.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් (UNDP) කළ ඉල්ලීමකට අනුව මෙම සංවාදය සංවිධානය කෙරිණි.





# පාර්ලිමේන්තු විදු පියසෙන්

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යමණ්ඩලය සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේද පිළිබඳ විශේෂ වැඩසටහනක්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යමණ්ඩලය සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම විශේෂ වැඩසටහනක් මේ මස 18 වැනිදා පැවැත්විණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශය සමග එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පෞද්ගලික කාර්යමණ්ඩලයට අනුයුක්ත කර ඇති පර්යේෂණ නිලධාරීන් හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරිහු මෙම වැඩසටහනට සහභාගී වූහ. මෙහිදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ජනකාන්ත සිල්වා මහතා විසින් මුඛ්‍ය දේශනය සිදු කරන ලදී.

මාර්ගගත තාක්ෂණය ඔස්සේ (ඔන්ලයින්) පැවති මෙම වැඩසටහන මඟින් පාර්ලිමේන්තුවේ කාර්‍යභාරය, පාර්ලිමේන්තු සම්ප්‍රදාය, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, කාරක සභා සහ එහි ක්‍රියාකාරිත්වය, ආදි සුවිශේෂී ක්ෂේත්‍ර රැසක් පිළිබඳව පුළුල් අවබෝධයක් සහභාගිවූවන්ට ලබා දුන් අතර, කෙටි වීඩියෝපට ප්‍රදර්ශනයක්ද සිදු කෙරිණි.

වැඩසටහනට සහභාගි වූ සියලු දෙනාටම පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක කටයුතු පිළිබඳව ඇති ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා විවෘත සංවාදයකට ද අවකාශ හිමිවිය.

පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිළිබඳ මෙවැනි දැන්වත් කිරීමේ වැඩසටහනක් සිය කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වීමට කිසියම් ආයතනයක්□ සංවිධානයක් හෝ කණ්ඩායම කැමැත්තක් දක්වන්නේ නම් https://www.parliament.lk/si/get-involved/edu-centre වෙත පිවිස තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කිරීමෙන් හෝ 0112777100 දුරකතන අංකය මගින් සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය ඇමතීමෙන් එය සිදු කර ගැනීමේ හැකියාව තිබේ.





# කාරක සභා පුවත්










# අමාත්‍යාංශ ලේකම්වරු පස්දෙනෙක් සහ තානාපතිවරයෙකුගේ පත් කිරීම සඳහා උසස් නිලතල කාරක සභාවේ අනුමතිය



අමාත්‍යාංශ ලේකම්වරුන් පස්දෙනෙකුට සහ තානාපතිවරයෙකුට පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය මේ මස 12 වැනිදා හිමි වූ බව පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

ඒ අනුව, ඉන්දුනීසියානු ජනරජයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස අද්මිරාල් (මහාචාර්ය) ජයනාත් කොළඹගේ මහතා පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව අනුමතිය ලබාදී තිබේ.

මේ අතර, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එම්.බී.ආර්. පුෂ්පකුමාර මහතාගේ පත්වීමට, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස ආර්.එම්.සී.එම්. හේරත් මහත්මියගේ පත්වීමට සහ මුදල්, ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කේ. එම්.එම්. සිරිවර්ධන මහතාගේ පත්වීමටත් උසස් නිලතල පිළිබඳ කාරක සභාව අනුමතිය ලබාදී තිබේ.

# නවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ කාරක සභා සඳහා සාමජික මන්ත්‍රීවරයන් පත් කෙරේ



නවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ කාරක සභා කිහිපයක් සඳහා සාමාජික මන්ත්‍රීවරයන් පත් කොට තිබේ.

මේ අනුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව සහ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සඳහා සමාජික මන්ත්‍රීවරුන් මෙම මස පත් කොට තිබේ.

තේරීම් කාරක සභාව විසින් ගනු ලැබූ ඒකමතික තීරණයකට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී (ආචාර්ය) ගරු හර්ෂ ද සිල්වා මහතා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිත්වයට පත් කරනු ලැබීය.

(මෙම කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප ඉදිරි පිටුවලින් දැක්වේ)

# පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව



කථානායකවරයා (සභාපතිවරයා)
නියෝජ්‍ය කථානායකවරයා
නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා
පාර්ලිමේන්තුවේ සභානායකවරයා
විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු එම්. යූ. එම්. අලි සබ්රි මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු මනෝ ගනේෂන් මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු සාගර කාරියවසම්
ගරු මහින්ද අමරවීර මහතා
ගරු වජිර අබේවර්ධන මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා


















# රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (සභාපති)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා



# ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු කනක හේරත් මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු අනුරාධ ජයරත්න මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා




# ගෘහය කාරක සභාව

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා
ගරු චන්දිම වීරක්කොඩි
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
සහ ගරු මර්ජාන් ෆලීල් මහතා














# පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව



ගරු කපිල අතුකෝරල මහතා
ගරු සු. නෝගරාදලිංගම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන්
රාසමාණික්කම් මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
සහ ගරු මංජුලා දිසානායක මහත්මිය

# ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු එස්. බී. දිසානායක මහතා
ගරු පවිත්‍රාදේවී වන්නිආරච්චි මහත්මිය
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු සාගර කාරියවසම් මහතා
ගරු යදාමිණි ගුණවර්ධන













# මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු සාරතී දුෂ්මන්ත මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු නිපුණ රණවක මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා



# පාර්ලිමේන්තුව සැකෙවින්...

## අගෝස්තු 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) / අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

### අගෝස්තු

### 2022.08.03

- 9 වන පාර්ලිමේන්තුවේ තෙවන සභාවාරය ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් විවෘත කිරීම සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

### 2022.08.09

- විසර්ජන සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

### 2022.08.09/10/12

- 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

### 2022.08.10

- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය කල්තැබීමේ යෝජනාවක් ලෙස විවාදයට ලක් කිරීම.

### 2022.08.29

- 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වූ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරන ලද බව පාර්ලිමේන්තුවට දැනුම් දීම.
- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 6 ප්‍රකාරව නියෝජ්‍ය කථානායක ධුරයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු තෝරා පත්කරගැනීම සඳහා 2022.05.05 සහ 2022.05.17 දෙදින පවත්වනු ලැබූ ඡන්ද විමසීම්වලදී භාවිතයට ගනු ලැබූ ඡන්ද පත්‍රිකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග විධි විධාන ප්‍රකාරව විනාශ කරනු ලැබූ බව පාර්ලිමේන්තුවට දැනුම් දීම.

### 2022.08.30

- විසර්ජන සංශෝදන පනත් කෙටුම්පත දෙවන වර කියවීම පැවැත්වීම.

### 2022.08.31

- විසර්ජන සංශෝධන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය ආරම්භ කිරීම.

## නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරේ.

පාර්ලිමේන්තු
ඡායා ගැලරිය







# පාර්ලිමේන්තු විත්ති


**පුවත් හසුන | 26 වැනි කාණ්ඩය | අගෝස්තු 2022**

**ISSN 2806 – 5425**



**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100    ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka